# 2

# තව්හීද් රිසාලත් සහ මආද්

ගුරුවරිය :

අස්සලාමු අලයික්කුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු

ශිෂ්‍යාවෝ :

වඅලයිකුමුස්සලාම් වරහ්මතුල්ලාහි වබරකාතුහු

ගුරුවරියඃ

දරුවනි; අපි සියලු දෙනාම මුඃමින්වරු නේ ද? ඔබගෙන් කාට ද මුඃමින් කියන්නේ කවු ද කියලා කියන්න පුළුවන් ?



අර්වා :



ටීචර් මම දන්නවා. අපේ උම්මා මට කියා දීලා තියෙනවා. මම කියන්න ද?

ගුරුවරිය :

හොඳයි ටිකක් හයියෙන් කතා කරන්න අර්වා

අර්වා :

ආමන්තුබිල්ලාහ්වල අඩංගු කරුණු විශ්ව ාස කරන අය මුඃමින් වෙනවා.

ගුරුවරිය :

අර්වා ඔබ හරි. බාරකල්ලාහු ලකි (අල්ලාහ් ඔබට බරකත් කරත්වා).

ළමයිනි අර්වා කිව්වා වගේ ආමන්තුබිල්ලාහ් යන්නෙහි අඩංගු කරුණු හය සැකයෙන් තොරව විශ්වාස කරන්නා මුඃමින් වෙනවා. අද පාඩමේ දී අපි මෙම අංශ හය ඇතුළත් මූලිකාංගයන් තුනක් කෙටියෙන් සළකා බලමු.

අමානා : ටීචර්, ඊමාන්හි කරුණු හයෙන් කරුණු තුනක් ගැන අද විස්තරාත්මකව කියා දෙනවා එහෙම නේද?

ගුරුවරිය : නෑ දුව. එම කරුණු හය මෙම තුනෙහි ඇතුළත් වෙනවා. ඒවා තව්හීද්, රිසාලත් සහ මආද් ය.

සෙනබ්ඃ එම පද වල තේරුම් මොනවා ද?

ගුරුවරියඃ තව්හීද් කියන්නේ ඒකීයත්වයට රිසාලත් කියන්නේ දූතභාවයට මආද් කියන්නේ නැවත නැගිටවන කියාමාවටය.

ෂෙමා : මේවයේ තේරුම තවත් විස්තර කරල කියල දෙන්න ගුරුතුමියනි

ගුරුතුමියඃ හොඳයි ෂෙමා අල්ලාහ් අපව මැව්වේ ය. ඔහු ඒකයාය. නැමඳුමට හා උදව් පැතීමට සුදුස්සා ඔහු පමණි. ඔහු අසම සමය. ඔහුට සහායකයකු ද නැත. ඔහු කිසිදු අවශ්‍යතාවක් ඇත්තෙකු නොවේ. කිසිවක් හලාල් හෝ හරාම් බවට පත්කිරීම ඔහුගේ ම අයිතිය වන්නේ ය. කුසල් අකුසල් යන සියල්ල ලැබෙන්නේ ඔහුගෙන් ය. මෙලෙස විශ්වාස කිරීම තව්හීදය (ඒකීයත්වය) වන්නේ ය.

අර්වා :

තව්හීදයට විරුද්ධ පදය ෂිර්ක් කියල උම්මා අපට කියා දීල තියෙනවා. ඒකේ තේරුම සම කිරීම යන්න නේද ටීචර්

ගුරුතුමිය :

ඔව් ඒක හරි ඒ නිසා තමයි, අල්ලාහ්ට තව දෙයක් සම කරන්නන්ට මුෂ්රික්වරු වශයෙන් හඳුන්වනු ලබන්නෙ. හොඳයි, අපි රිසාලත් යන දූත මෙහෙවර ගැන බලමු. මිනිසා මැවූ අල්ලාහ් ඔහු මෙලොව ජීවත් විය යුතු ආකාරය ගැනත් මග පෙන්වූයේ ය. අල්ලාහ්ගේ එම මගපෙන්වීම් ආගම් නම්, මෙම ආගම් දේශනා කිරීම සඳහා මිනිසුන් අතරින් යහපත් අය සහ සුදුස්සන් අල්ලාහ් තේරුවේය. අපි නබිවරුයෝ යැයි හඳුන්වන්නේ ඔවුන් ය. ඔවුනතර සිටි විශේෂිත රසූල්වරු යැයි හඳුන්වනු ලබති.

දරුවනි, මලාඉකවරුන් අතරින් වැදගත්ම මලාඉකවරයා ජිබ්රිල් (අලයි) තුමාය. අල්ලාහ් ආගම් සහ සුහුෆු පහළ කළේ මෙතුමා හරහා ය. අප රිසාලත් දූත මෙ හෙවර යැයි හඳුන්වන්නේ මෙයයි.

අර්වා :

ගුරුතුමියනි, ජිබ්රීල් (අලයි) තුමා නබිවරුන්ට වහී ගෙනෙන බව උම්මා කිව්වා. ඒකට නේ ද ඔබතුමිය රිසාලත් කිව්වේ ?

ගුරුතුමිය :

"මාෂා අල්ලාහ් " අර්වා ඔබ කියපුවා හරි. ඔබගේ උම්මා ඔබට ගොඩක් ආගමික කරුණු කියා දීලා තිබෙන බව පේනවා. දරුවනි, ඔබත් අර්වා වගේ ආගමික කරුණු දෙමව්පියන්ගෙන් අහල ඉගෙන ගන්නත්, පොත් පත් කියවා දැනග න්නත් වැයම් කළ යුතුයි. ආදරණීය දරුවනි, ඔබ එහෙම කරනවා නේ ද?

ශිෂ්‍යාවෝ :

ඉන්ෂා අල්ලාහ් ගුරුතුමියනි අනිවාර්යයෙන් අපි එහෙම කරනවා.

ගුරුතුමිය :

දරුවනි, දැන් මආද් යන කියාමාව පිළිබඳ විශ්වාසය ගැන බලමු. මරණයත් සමග මිනිස් ජීවිතය අවසන් වන්නේ නැත. කබ්ර් හි මිනිස්සු නැවැත නැගිටවනු ලබති. ඔවුහු මුන්කර් නකීර් යන මලාඉකවරුන් විසින් ප්‍රශ්න කරනු ලබති. ප්‍රශ්න කිරීමෙන් පසුව කබ්ර් ජීවිතය ස්වර්ගයේ උද්‍යානයක් හෝ නිරයේ වළක් වන්නේ ය.

ඉල්මා :

ගුරුතුමියනි දෙවන සූර් පිඹීම සමග මිනිසුන් මහ්ෂර් පිටියේ දී රැස් කරනු ලබන බව රසානා ගුරුතුමිය කිව්වා. ඒ කබ්ර් ජීවිතයෙන් පස්සේ නේ ද?

ගුරුතුමිය :

ප්‍රථම සූර් පිඹීමත් සමග ලෝක විනාශය ආරම්භ වෙනවා. සියලුම ජීවීන් මැරී යනවා. නියමිත කාලයේ දී දෙවන සූර් පිඹීමත් සමග මළ අය පණ ලැබ නැගිටිති. ඔවුහු මහ්ෂර් යන පිටියේ රැස් කරනු ලබති. ඉන් පසු ප්‍රශ්න ඇසීම සිදුවේ. පින් කළ අය ස්වර්ගයටත් පව් කළ අය නිරයටත් යවනු ලබති. මෙම කරුණු සියල්ලටම මආද් යැයි කියන්නෙමු.

දැන් තව්හීද් රිසාලත් සහ මආද් යන පදවල අර්ථය ඔබට පැහැදිලිව දැන ග න්නට ලැබුනා.

ඉන්ෂා අල්ලාහ් ඊළඟ පාඩමේ හමුවෙමු.

ශිෂ්‍යයන්:

ජසාකල්ලාහු හයිරන්

1. පහත සඳහන් අරාබි පදවල තේරුම සඳහන් කරන්න

(අ) තව්හීද් (ආ) මුඃමින් (ඇ) ආමන්තුබිල්ලාහ් (උ) රිසාලත් (ඌ) මආද්

2. අල්ලාහ් පිළිබඳව ඔබ විශ්වාස කරන්නේ කෙසේ ද?

3. රසූල්වරු යනු කවරුන් ද?

4. සූර් පිඹීමත් සමග කුමක් සිදුවේ ද?

5. පහත නම් සඳහන් මලාඉකාවරුන්ගේ කාර්යය සඳහන් කරන්න

අ) ජිබ්රීල් අලයිහිස්සලාම්

ආ) මුන්කර් නකීර් අලයිහිමස්සලාම්

ඇ) මීක්කාඊල් අලයිහිස්සලාම්